# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 අගෝස්තු මස 04 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2017.08.08 දින නිකුත් කරන ලදී.)**

# සුකියෝ මහිකරි ශ්‍රී ලංකා (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**සුකියෝ මහිකරි ශ්‍රී ලංකා සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කේ. පියදාස මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**සුකියෝ මහිකරි ශ්‍රී ලංකා සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

''සුකියෝ මහිකරි ශ්‍රී ලංකා'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලුම කරුණු ඵලදයී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් අධ්‍යාත්මික සංවිධානයක් වශයෙන් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් හා එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2017 අංක    දරන සුකියෝ මහිකරි ශ්‍රී ලංකා (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) සුකියෝ මහිකරි ශ්‍රී ලංකා සංගමයේ දැනට සිටින තාක් සාමාජිකයන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව, ''සුකියෝ මහිකරි ශ්‍රී ලංකා'' යන නාමය හා අභිධානය යටතේ (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. සුකියෝ මහිකරි ශ්‍රී ලංකා සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාව තුළ මහිකරි අධ්‍යාපනය වර්ධනය කිරීම සහ ඊට අදාළව සම්මන්ත්‍රණ සහ අධ්‍යයන පංති පැවැත්වීම;

(ආ) තම සාමාජිකයනට සහ අනෙකුත් සාමාන්‍ය ජනතාවට දිව්‍ය ආලෝකය (සත්‍ය ආලෝකය) ලබා දීම;

2—PL 005337—300 (2017/07)

(ඇ) අනෙකුත් රටවල පිහිටි මහිකරි මධ්‍යස්ථානය සමග සම්බන්ධතා පැවැත්වීම සහ මුලු දිවයින තුළම මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඈ) ජපානයේ සුකියෝ මහිකරි සමග සබඳතා ගොඩනැගීම හා පවත්වාගෙන යාම;

(ඉ) පදනම පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන, වාර සඟරා සහ අනෙකුත් ලිපි හා තොරතුරු ප්‍රකාශයට පත් කිරීම;

(ඊ) පදනම විසින් නීත්‍යනුකූලව සේවයේ යොදවා ඇති තැනැත්තන්ගේ සුබසාධන කටයුතුවල නියැලීම;

(උ) යෝකෝ ෆාමින් (ඓන්ද්‍රීය අධ්‍යාත්මික ගොවිපළ, ඇති කිරීම සහ නගාසිටුවීම; සහ

(ඌ) ඉහත සඳහන් පරමාර්ථ සහ එහි අභිවෘද්ධිය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන බැංකු ගිණුම් ශ්‍රී ලංකාව තුළ සහ විදේශ රටවල විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද, ආධාර මුදල් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ අරමුදල නංවාලීමේ අරමුණින් ස්වකීය අරමුදල් ශ්‍රී ලංකාවේ හෝ පිටරටවල ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමර්ථ ඉටුකරගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවර වුව ද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේ ඉටු කිරීමේ, සිදුකිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**5.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ සභාපතිවරයාගෙන්, උප සභාපතිපරයාගෙන්, ලේකම්වරයාගෙන්, භාණ්ඩාගාරිකවරයාගෙන් සහ අවශ්‍යතාවය අනුව පත් කරන ලද අධ්‍යක්ෂවරුන් තුන්දෙනකු දක්වා සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ

තත් කාලයේ වලංගුව බල පවත්නා රීතිවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) ජපානයේ සුකියෝ මහිකරි සංවිධානයේ අධ්‍යාත්මික නායකයා සංස්ථාවේ පාලක අධ්‍යක්ෂවරයා වන අතර ඔහු/ ඇය විසින් සංස්ථාවේ සභාපතිවරයා පත් කළ යුතු ය.

(3) මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින්, එහි යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත්කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ චර්යාව;

(ඇ) සභාපතිවරයා හැර කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අධ්‍යාත්මික නායකයාගේ අභිමතය පරිදි තෝරා පත් කර ගැනීම;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ නිල කාලය පිළිබඳ තීරණ ගැනීම;

(ඉ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය පිළිබඳ තීරණ ගැනීම;

(ඊ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, එහිදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වනු

ලබන වේලාවන්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම, න්‍යාය පත්‍රය සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(උ) ඕනෑම රැස්වීමක ගණපූරණය, සභාපතිවරයා සහ ලේකම්වරයා ඇතුළුව 04 දෙනකුට නොඅඩු විය යුතු ය;

(ඌ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(එ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ පරිද්දෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පදනමේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාව විසින් භාරගනු ලබන සියලුම මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**8.** (1) සංස්ථාවේ සියලුම ආදායම හා වියදම පිළිබඳ ගිණුම් නිසි අයුරින් තබාගැනීමට කළමනාකරණ මණ්ඩලය පියවර ගත යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින්, යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව ඔවුන් විසින් සහතික කළ යුතු ය.

**සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු ණය.**

**9.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු සියලු ණය, සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංස්ථාව විසුරුවා හැරීමේ දී දේපළ බැහැර කිරීම.**

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි ණය සහ බැරකම් පියවීමෙන් පසුව, මුදල් ඇතුළුව යම් දේපළක් ශේෂ වුවහොත් එවැනි දේපළ සහ මුදල් තත් කාර්යය සඳහා කැඳවනු ලැබූ විශේෂ මහා සභා රැස්වීමක දී සංස්ථාව විසින් තීරණය කළ හැකි වන පරිදි සමාන පරමාර්ථයන් ඇත්තා වූ වෙනත් යම් සමිතියකට හෝ මණ්ඩලයකට සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ සඳහා උපයෝගී කර ගැනීම පිණිස පවරනු ලැබිය හැකි ය.

**සාමාජිකයන් සහ නිළධරයන්ගේ වගකීමේ ආරක්ෂාව.**

**12.** පදනමේ තක්කාලීනව සේවයේ යොදවා ඇති සාමාජිකයන්, ලේකම්, විගණකවරුන්, කළමනාකාරවරුන් සහ සේවකයන්ද ඇතුළුව අනෙකුත් නිළධාරින්, පදනමේ කුමන හෝ කටයුත්තක් කිරීමේ දී කරනු ලබන කටයුතු වලින්, දරන වියදම්වලින් හා ගාස්තු වලින්ද සිදුවන පාඩු වලින් නිදහස් වන අතර, ඔවුන් විසින් කරනු ලබන කාර්යයන්ට හා ලැබීම් පැහැර හැරීම් සඳහා ඔවුන් වගකිව යුතු නොවේ.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ මුද්‍රාව, සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සනක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අනාගයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ අන්කිසි රාජ්‍ය සංස්ථාගත ආයතනයක හෝ වෙනත් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.